උපදෙස් පත්‍රිකා බැ/නි/ඒ/2013/3

සියළුම සමුපකාර සංවර්ධන කොමසාරිස්වරුන්වෙත,

2013 සැප්තැම්බර් මස 12 වැනි දින රැස් වූ සමුපකාර ග්‍රාමීය බැංකු සහ මූල්‍ය සේවා සමිති පිළිබඳ ජාතික නියාමන කමිටුව විසින් ගන්නා ලද තීරණය පහත දැක්වේ.

අදාල සමුපකාර සමිති මෙම උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

## තැන්පතු සඳහා ගෙවිය හැකි උපරිම පොළී අනුපාතිකය

සමුපකාර ග්‍රාමීය බැංකු සහ වෙනත් මූල්‍ය සේවා සමුපකාර සමිති/සංගම්වල උපරිම තැන්පතු පොලී අනුපාතිකය සම්බන්ධයෙන් අනුගමනය කළයුතු ක්‍රියාමාර්ගය පහත දැක්වේ.

### ස්ථාවර තැන්පතු

1. කල් පිරීමේ කාලය මාස 12ක් හෝ ඊට අඩු

වාර්ෂික පොළී අනුපාතිකය මහ බැංකුව විසින් සපයන ලද දත්තයන්ට අනුව දින 364 භාණ්ඩාගාර බිල්පත්වල පසුගිය කාර්තුවට අදාල බර තබන ලද සාමාන්‍ය ඵලදාවට ප්‍රතිශත අංක 2 කට වඩා වැඩි නොවිය යුතුය.

2. කල් පිරීමේ කාලය මාස 12 ට වැඩි එහෙත් මාස 36 ට අඩු

වාර්ෂික පොළී අනුපාතිකය මහ බැංකු දත්තයන්ට අනුව දින 364 භාණ්ඩාගාර බිල්පත්වල පසුගිය කාර්තුවට අදාල බර තබන ලද සාමාන්‍ය ඵලදාවට ප්‍රතිශත අංක 2.5 ට වඩා වැඩි නොවිය යුතුය.

3. කල් පිරීමේ කාලය මාස 36 ට වැඩි

වාර්ෂික පොළී අනුපාතිකය මහ බැංකු දත්තයන්ට අනුව දින 364 භාණ්ඩාගාර බිල්පත්වල පසුගිය කාර්තුවට අදාල බර තබන ලද සාමාන්‍ය ඵලදාවට ප්‍රතිශත අංක 3 කට වඩා වැඩි නොවිය යුතුය.

4. කෙසේ වුවද සමූපකාර ග්‍රාමීය බැංකු සහ වෙනත් මූල්‍ය සේවා සමිතිවලට යම් විශේෂිත කාල සීමාවක් සඳහා වාර්ෂික පොළී අනුපාතිකය තවත් ප්‍රතිශත අංක 1 කින් ඉහල දැමීම සඳහා අනුමැතිය දීමට පළාත් කොමසාරිස්වරුන්ට අවකාශ තිබේ. මේ සඳහා තමන්ට එම පොලී අනුපාතිකය යටතේ ලාභදායී ලෙස ණය/ආයෝජන අවස්ථා ඇති බව තහවුරු කරමින් සමූපකාර සමිති විසින් ඉල්ලීම් ඉදිරිපත් කළ යුතුය.

<u>ඉතුරුම් තැන්පතු</u>

සමූපකාර ග්‍රාමීය බැංකු සහ වෙනත් මූල්‍ය සේවා සමිති විසින් ඉතුරුම් තැන්පතු සඳහා ගෙවිය හැකි උපරිම වාර්ෂික පොලිය සඳහා ද පදනම විය යුත්තේ භාණ්ඩාගාර බිල්පත් සඳහා පසු ගිය කාර්තුවට අදාල බර තබන ලද සාමාන්‍ය ඵලදාවයි. එහෙත් මෙහිදී සලකා බලන්නේ දින 364 ක් නොව දින 91 ක කල් පිරීමක් සහිත භාණ්ඩාගාර බිල්පත්වල සාමාන්‍ය ඵලදාවයි. ගෙවනු ලබන පොලිය එම සමාන්‍ය ඵලදාවට වැඩි නොවිය යුතුය. මෙහිදී ස්ථාවර තැන්පතු වලදී මෙන් තවත් ප්‍රතිශත අංක එකතු කිරීමක් සිදු නොවේ.

<u>ජ්‍යෙෂ්ඨ පුරවැසි සහන</u>

ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර ඉතුරුම් තැන්පතු සඳහා උපරිම වශයෙන් අතිරේක ප්‍රතිශත අංක එකක් වාර්ෂික පොලී අනුපාතිකයට එකතු කිරීමට සමූපකාර සමිති වලට තීරණය කල හැකිය. මෙහිදී ජ්‍යෙෂ්ඨපුරවැසි යනු ගිණුම විවෘත කරන අවස්ථාවේ හෝ අළුත් කරන අවස්ථාවේ වයස අවුරුදු 55 ට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්ය.

ඩබ්ලිව්.එච්. කරුණාරත්න,
සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමූපකාර සමිති රෙජිස්ට්‍රාර්